**ශීර්ෂය 266- වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

**-----------------------------------------------------**

**1.** **මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**1.1** **මතය**

**-----**

වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජූනි 23 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 අගෝස්තු 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2** **මතය සඳහා පදනම**

**---------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උපවගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

**1.6.1** ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ මූලධන වත්කම් පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම සඳහා රු.8,667,539 ක් වැයකර තිබුණ ද, ඒවා ස්ථාවර වත්කම් ලෙස ප්‍රාග්ධනිත කර නොතිබුණි. | වත්කමක වටිනාකම වැඩිකරන වියදමක් පමණක් ස්ථාවර වත්කම් ලෙස එකතු කෙරේ. එමෙන්ම, දේපළ පිරියත හා උපකරණ ප්‍රකාශයේ මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීමේ වියදම් එකතු කිරීම සඳහා දැනුම් දීමක් ද සිදුකර නොතිබුණි. | ප්‍රාග්ධන ස්වරූපයේ වියදම් ස්ථාවර වත්කම් ලෙස දැක්වීමට කටයුතු කළ යුතු ය. |

**2.** මූල්‍ය සමාලෝචනය

**2.1** වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) එක් වැය විෂයයක් සඳහා සලසා තිබූ ප්‍රතිපාදනයෙන් සියයට 100ක් හෙවත් රු.100,000,000ක් ඉතිරි වී තිබුණි. | පරිපූරක ඇස්තමේන්තු මගින් වෙන්කළ මෙම ප්‍රතිපාදනය සඳහා අප විසින් ඉල්ලීම් කර නොතිබුණි. | වැරදි සටහන් නොපමාව නිවැරදි කරගත යුතුය. |
| (ආ) වවුනියා ආර්ථික මධ්‍යස්ථානයේ පුනරාවර්තන ස්වරූපයේ වූ ආරක්ෂක සේවා හා විදුලිය ගාස්තු රු.781,302ක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් මූලධන වැය විෂයයක් යටතේ ගෙවා තිබුණි. | අමාත්‍යාංශය විසින් මූලධන වැය විෂයක් යටතේ ආරක්ෂක සේවා වියදම් සඳහා ප්‍රතිපාදන මුදාහැර තිබුණි. | නිවැරදි වැය විෂයය යටතේ වියදම් ගිණුම්ගත කළ යුතුය. |

2.2 බැරකම් සහ බැඳීම්වලට එළැඹීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා භාණ්ඩාගාරය විසින් සකස් කළ බැරකම් ප්‍රකාශ අතර රු.33,138ක නොසැසඳුණු වෙනස්කම් පැවැතිණි. | භාණ්ඩාගාර මුද්‍රිත පිටපත්වල එම වටිනාකම සඳහන් නොවීමට හේතු දැනගත නොහැකි විය. | භාණ්ඩාගාර සටහන් හා සසඳා ගිණුම් පිළියෙල කළ යුතුය. |

**2.3 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු 17ක් විසින් ලබාදුන් පුනරාවර්තන හා මූලධන ප්‍රතිපාදනවලින් සියයට 12ත් සියයට 100ත් අතර පරාසයක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | ප්‍රතිපාදන ලැබීම් ප්‍රමාද වීම, වසංගත තත්ත්වය, අක්මුදල් ප්‍රමාණවත් නොවීම වැනි හේතු නිසා ඉතිරිවීම් පැවැතුණි. | ලද ප්‍රතිපාදන ඵලදායී ලෙස උපයෝජනය කළ යුතුය. |

2.4 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 3.4 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි. | විගණන විමසුම් පරිවර්තනය කර පිළිතුරු ලබාගැනීමට සිදු වීම හා විනය පරීක්ෂණ සිදුකර වාර්තා ඉදිරිපත් කළ යුතු වීම නිසා පිළිතුරු ලබා දීමේ කාල ප්‍රමාදයක් සිදු වී තිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

2.5 නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වර්ෂ 10 සිට 12 දක්වා කාලයක් ප්‍රමාද වී තිබුණු වාහන අනතුරු 02ක පරීක්ෂණ කටයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 104 ට අනුකූලව, මේ දක්වාම අවසන් වී නොතිබුණි. | අමාත්‍යාංශ අනුමැතිය ලද පසු පොත්වලින් කපාහැරීමේ කටයුතු සිදුකරනු ලැබේ. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වවුනියා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සෞභාග්‍යා ව්‍යාපෘතිය සඳහා මුදල් රෙගුලාසි 137 සහ 138 ට පටහැනිව, භාණ්ඩ ඒකක 40 ක් මිලදී ගැනීමට පෙර 2021 දෙසැම්බර් 31 දින රු.682,051ක චෙක්පත් ලියා කාර්යාලයේ රඳවා තිබුණි. මේ දක්වාම එම භාණ්ඩ ලබාගැනීමට සහ ගෙවීම් කිරීමට කටයුතු කර නොතිබුණි. | වටිනාකම රු.682,051 ක් වූ චෙක්පත පමණක් ගෙවිය යුතුව ඇති බවට දන්වා සිටිමි. | නියමිත කාලයේදී භාණ්ඩ ලබාගැනීමට සහ ගෙවීම් සිදුකිරිමටත් කටයුතු කළ යුතුය. |

3.2 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට හා වෙන්ගලසෙට්ටිකුලම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් රජයේ නිවාස 17 ක් මාස 03ත් වර්ෂ 05 ත් අතර කාලයක සිට අභාවිතව පවතී. | අළුත්වැඩියා කටයුතු සිදුකිරීමට අරමුදල් ප්‍රමාණවත් නොවීම ඊට හේතුව වී තිබුණි. | වත්කම් අභාවිතව නොතැබිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වවුනියාව හා වෙන්ගලසෙට්ටිකුලම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අයත් අබලන් වූ රජයේ නිවාස 02 ක් සම්බන්ධයෙන් වර්ෂ 05 කට අධික කාලයක සිට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වෙන්ගඩසෙට්ටිකුලම් රජයේ නිවාස භාවිතා කළ නොහැකි නිසා ඉවත් කිරීමට පියවර ගනු ලැබේ. | භාවිතා කිරිමට නොහැකි වත්කම් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සතු යතුරු පැදි ඇතුළු වාහන 25 ක් වර්ෂ 02 ත් වර්ෂ 10 ත් අතර කාලයක සිට අළුත්වැඩියා නොකර අත්හැර දමා තිබුණි. | වාහනවල තත්ත්වය අනුව අළුත්වැඩියා කිරීමට, වෙන්දේසි කිරීමට හා වෘත්තීය පුහුණු අධිකාරියට භාරදීමට කටයුතු කෙරේ | වත්කම් අභාවිතව නොතැබිය යුතුය. |
| (ඈ) | 2018 වර්ෂයේදී රු.16,093,613 ක වියදමින් ඉදිකළ ඕමන්ත සංස්කෘතික මධ්‍යස්ථානය වර්ෂ 03කට වැඩි කාලයක සිට අභාවිතව පවතී. එමෙන්ම, 2020 වර්ෂයේදී මෙම මධ්‍යස්ථානය සඳහා මිල දී ගත් රු.991,670 ක් වටිනා භාණ්ඩ ඒකක 349 ක් ද වර්ෂකට වැඩි කාලයක සිට අභාවිතව හා අනාරක්ෂිතව පැවැතිණි. | මෙම මධ්‍යස්ථානයට සංවර්ධන හා ආරක්ෂක නිලධාරියෙකු බැගින් අනුයුක්ත කිරීමට සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය පියවර නොගැනීම මීට හේතුව වී තිබුණි. | වත්කම් අභාවිතාව නොතැබීමට පියවරගත යුතුය. |
| (ඉ) | සෞභාග්‍යා ව්‍යාපෘතිය යටතේ 2021 වර්ෂයේදී මිල දී ගත් රු.1,087,825 ක් වටිනා භාණ්ඩ ඒකක 103ක් මේ දක්වාම වවුනියා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රඳවා තිබුණි. | මධ්‍යස්ථාන ක්‍රියාත්මක වීමෙන් පසුව මෙම භාණ්ඩ භාරදෙනු ලැබේ. | ව්‍යාපෘතිය ඇරඹීමට පෙර භාණ්ඩ මිලදී නොගත යුතු අතර අරමුණු ඉටු කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගතයුතුය. |

3.3 අනාර්ථික ගනුදෙනු
--------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වවුනියාව ආර්ථික මධ්‍යස්ථානය මේ දක්වාම භාවිතයට නොගැනීම නිසා 2018 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා එහි ආරක්ෂක හා පවිත්‍රතා කටයුතු, ජල ගාස්තු හා උපකරණ මිල දී ගැනීම් වෙනුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් දරන ලද රු.4,848,147 ක් අනාර්ථික වියදමක් වී තිබුණි. | මෙම මධ්‍යස්ථානය ආරම්භ වන තෙක් නියමිත ආකාරයෙන් නඩත්තු නොකළහොත් ඒවා භාවිතා කළ නොහැකි තත්ත්වයට පත්විය හැකි බැවින් එය නඩත්තු කර ආරක්ෂා කිරීමට වියදම් කරනු ලැබේ. | වත්කම් අභාවිතව නොතැබිය යුතුය. |

3.4 විගණන විමසුම් සඳහා පිළිතුරු ලබානොදීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විගණන විමසුම් 02 ක් සඳහා පිළිතුරු ලබාදී නොතිබූ කාල පරාසය මාස 10 සිට මාස 15 ක් දක්වා පැවැතුණි. | විගණන විමසුම් පරිවර්තනය කර පිළිතුරු ලබා ගැනීමටත් විනය පරීක්ෂණ සිදුකර වාර්තා ඉදිරිපත් කිරීමටත් සිදු වීම නිසා පිළිතුරු ලබා දීමට ප්‍රමාද වී තිබුණි. | විගණන විමසුම් සඳහා නොපමාව පිළිතුරු ලබාදීමට කටයුතු කළ යුතුය. |

3.5 කළමනාකරණ දුර්වලතා

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වවුනියා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් රජයේ නිවාසවලින් මාස 01 ත් වර්ෂ 10 ත් අතර කාලයක සිට පවතින හිඟකුලී රු.1,013,050 ක් අයකර නොතිබුණි. | මේ සඳහා සිහිගැන්වීමේ ලිපි යවා ඇත. | නියමිත කාලය තුළ හිඟකුලී අයකර ගැනීමට පියවර ගත යුතු අතර ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) ත්‍රස්ත විමර්ශන ඒකකය වෙත 2011 වර්ෂයේදී ලබා දී තිබුණු දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් රජයේ නිවාසයක බදු කාලය ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 6.1 උපවගන්තිය පරිදි අවසන් වී තිබුණි. එහෙත්, එම නිවාසය ආපසු ලබා ගෙන නොතිබුණු අතර 2011 මැයි මාසයේ සිට 2021 දෙසැම්බර් මාසය දක්වා පැවැති රු.307,200 ක හිඟ කුලිය අයකිරීමට ද පියවර ගෙන නොතිබුණි. | එම නිවාසය හා හිඟකුලී ලබා ගැනීමට ඉල්ලීම් කළ ද, අදාළ දෙපාර්තමේන්තුව විසින් කිසිදු පියවරක් ගෙන නොතිබුණි. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව ක්‍රියාමාර්ග ගෙන හිඟ කුලී අයකිරීමට පියවර ගත යුතුය. |
| (ඇ) විශ්‍රාමික විධායක නිලධාරියෙකු විසින් කුලී ගෙවීමකින් තොරව, අනවසරයෙන් මාස 13ක කාලයක් රජයේ නිවාසයක පදිංචි වී සිටීමට එරෙහිව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි. | අදාල නිවස භාරදෙන ලෙසත් හිඟකුලී නිරවුල් කරන ලෙසත් දැනුම් දී ඇත. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඇ) | අංක 08/2019 හා 2019 මාර්තු 27 දිනැති ස්වදේශ කටයුතු චක්‍රලේඛයට සහ අංක 13/2008 හා 2008 ජූනි 26 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට පටහැනිව 2021 වර්ෂය සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක නිලධාරීන්ට වෙන් කළ වාහන සඳහා අනුමත ඉන්ධන සීමාව ඉක්මවා ලීටර 1366 ක් වෙනුවෙන් රු.148,999 ක ගෙවීම් කර තිබුණි. | අභ්‍යන්තර කටයුතු පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශයෙන් අවශ්‍ය අනුමැතිය සඳහා උපදෙස් ලබාගෙන පසුව ඊට අනුකූලව කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛ උපදෙස්වලට අනුකූලව කටයුතු කළයුතුය. |

4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල 2021 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩල පුරප්පාඩු 68ක් හා අතිරික්ත 06ක් පැවැතුණි. | පත්කිරීමේ බලතල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට නොමැති බැවින් පුරප්පාඩු පිළිබඳ අදාළ අමාත්‍යාංශ වෙත දැනුම් දී ඒ අනුව නව පත්වීම් සහ ස්ථාන මාරුකිරීම් කාලීනව සිදුකරනු ලැබේ. | සේවා අවශ්‍යතා සැලැකිල්ලට ගෙන පුරප්පාඩු සහ අතිරික්ත සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |